# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 41 — 1973 ජනවාරි 05 වැනි සිකුරාදා — 1973.01.05

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 7 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 1 | මිළ පාලන දැන්වීම් ... ... ... | 10 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 11 |
| අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩලවලින් කරන පත්කිරීම් ආදිය ... | 1 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 5 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 14 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | "සුරාබදු ආඥපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 15 දරන ආදායම් උපරිමය හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ පනත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 16 දරන ප්‍රාග්ධන බදු (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 17 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත 1973 ජනවාරි මස 05 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## ජනාධිපතිතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 1**

අංකය : ඩී. 380/ආර්ජීසීටී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද මාරු කිරීමක්**

1972 දෙසැම්බර් මස 01 දින සිට ගැමුණු හේවා බලඇණිය වෙතින් ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය වෙත පහත නම සඳහන් නිලධාරියාගේ මාරු කිරීම :—

කපිතාන් තුසෙව්නම්බි දනසිරි රාජපක්ෂ, ගැ.හේ.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 18 දින,
කොළඹ දී ය.

1-240

## අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩලවලින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 2**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126(5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත් කිරීම් කර ඇත :—

අංකය : ජේඑල්/ඩී. 22/59.

1972 ඔක්තෝබර් මස 31 දින සහ 1972 නොවැම්බර් මස 9 සිට 11 දක්වා ටී. ඩී. පී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ගුණරත්න මහතා පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස 19 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**


1——ඩී 70750—10,479 (72/12)

අංකය : ජේඑල් / ඩබ්ලිව්.13/67.

1972 ඔක්තෝබර් මස 26 සිට 30 දක්වා ඩබ්ලිව්. එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. එම්. හලල්දීන් මහතා පොලොන්නරුවේ ක්‍රියා කරන අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / ඩබ්ලිව්.13/67.

1972 ඔක්තෝබර් මස 30 දින ඩබ්ලිව්. එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. බී. සංගක්කාර මහතා පොලොන්නරුවේ ක්‍රියා කරන අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඒ/46/48.

1972 දෙසැම්බර් මස 5 වැනි දින එන්. එස්. සී. අලගමුත්තු මහතා හැටන් ම.උ. අංක 12715 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස හැටන්හි ක්‍රියා කරන නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඒ.47/48 (VI)

1972 නොවැම්බර් මස 2 දින ටී. ගුණරත්න මහතා පානදුර අංක 12667 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / ඩබ්ලිව්14/67.

1972 ඔක්තෝබර් මස 27 සහ 30 දිනයන්හි ඩබ්ලිව්. ජී. එන්. වීරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. කේ. විජේසිංහ මහතා හොරණ ක්‍රියා කරන පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / ඩබ්ලිව්./14/67.

1972 නොවැම්බර් මස 7 සහ 8 දිනයන්හි ඩබ්ලිව්. ජී. එන්. වීරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. ආර්. ජයවර්ධන මහතා හොරණ ක්‍රියා කරන පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / සී.19/57.

1972 නොවැම්බර් මස 3, 6, සහ 7 දිනයන්හි කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / ජී.15/71.

1972 දෙසැම්බර් මස 1 සහ 2 දිනයන්හි වයි. එච්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. ඊ. එම්. මුතුක්‍රිෂ්ණා මහතා නාරාහේන්පිට පිහිටි රථවාහන උසාවියේ ක්‍රියා කරන කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ඒ.15/72.

1972 නොවැම්බර් මස 17 සහ 18 දිනයන්හි එම්. ෆුසෙඩ්. අසී. අසීස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු වෝල්ටර් සී. පෙරේරා මහතා බම්බලපිටියේ පිහිටි උසාවියේ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / එස්.26/61.

1972 ඔක්තෝබර් මස 21 දින සහ 1972 නොවැම්බර් මස 11 සිට 14 දින දක්වා ජේ. සෝනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ඊ. වීරසූරිය මහතා ගාල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට

අංකය : ජේඑල් / සී.26/63.

1972 නොවැම්බර් මස 2 වැනි දින එම්. ඊ. ධර්මවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. ඕ. කේ. පෙරේරා මහතා මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / සී.26/63.

1972 නොවැම්බර් මස 3 වැනි දින එම්. ඊ. ධර්මවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, නිස්සංක විජේසුන්දර මහතා මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේ.එල් / එස්25/61.

1972 නොවැම්බර් මස 1, 3, 10, 17 සහ 22 දිනයන්හි ජේ. බී. සී. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු. එම්. ඕ. එම්. තහීර් මහතා කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේ.එල් / ඩබ්ලිව්.20/71.

1972 ඔක්තෝබර් මස 27 වැනි දින ටී. එම්. වරුසවිතාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, බී. විජේසිංහ මහතා ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේ.එල් / ඩබ්ලිව්.20/71.

1972 ඔක්තෝබර් මස 28 දින ටී. එම්. වරුසවිතාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. ඒ. එල්. ගුණරත්න මහතා ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේ.එල් / ඩබ්ලිව්.20/71.

1972 නොවැම්බර් මස 1 සහ 11 දිනයන්හි ටී. එම්. වරුසවිතාන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. ශ්‍රී ගුණවර්ධන මහතා ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / සී..29/66.

1972 නොවැම්බර් මස 7 දින සහ 11 සිට 15 දක්වා ආර්. එල්. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ගම්පොල මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / පී.7/67.

1972 ඔක්තෝබර් මස 27 සිට 29 දක්වා කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. චින්නයියා මහතා කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / පී.7/67.

1972 නොවැම්බර් මස 5 සිට 9 දක්වා කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. අලගයියා මහතා කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල් / එස්.27/62.

1972 නොවැම්බර් මස 10 සිට 12 දක්වා බී. ආර්. සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. එස්. වී. පෙරේරා මහතා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීඑල්ටී/ඒඒ/1972 (II).

එස්. දර්මලිංගම් මහතා කොළඹ (13) 13/කේ.ටී./2110, 2111, 2151, 2152 හා 1834, 13/කේටී/2258, 1657, 1359, 2244—45, 1857, 2236, 2239, 1827, 2147—48, 2139, 2271, 2208, 2155 හා 1698 දරණ නඩු ඇසීමට හෝ අසා නිමකර තීන්දුදීමට 1972 දෙසැම්බර් මස 12 සිට 23 වැනි දින දරණ නඩු ඇසීමට හෝ අසා නිමකර තීන්දුදීමට හෝ වැඩබලන කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඒඒ/44/57.

එන්. එච්. ප්‍රනාන්දු මහතා 1972 දෙසැම්බර් මස 12 වැනි දින සිට හිඟුරක්ගොඩ ගම්බද උසාවියේ අංක 6991, 6992, 6993, 6995, 6996 සහ 6997 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමන්කඩුව, කලාගම් පලාත උතුර සහ කලාගම් පලාත දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ හුරුළු පලාත දකුණ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට. දින 15කින් පසු මෙම පත්වීම අවසාන වේ.

අංකය : පීඒඒ/35/57.

සී. ඒ. එස්. ටී. ක්‍රිස්පින් මහතා 1972 දෙසැම්බර් මස 11 වැනි දින සිට නාරම්මල ගම්බද උසාවි අංක 971 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, පන්නල, බිංගිරිය සහ දඹදෙනි හත්පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට. දින 15කින් පසු මෙම පත්වීම අවසාන වේ.

අංකය : පීඒඒ/25/57.

කේ. සින්නතම්බි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1972 නොවැම්බර් මස 24 වැනි දින සිට චන්කනෙයි ගම්බද උසාවියේ අංක 9912 දරණ නඩුව ඇසීමට සහ අසා නිම කර තීන්දුව දීම පිණිස යාපනය දිස්ත්‍රික්කයේ දිවයින්වල සහ බටහිර වලිකාමම්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට. දින 15කින් පසු මෙම පත්වීම අවසාන වේ.

අංකය : පීඒඒ/1/57.

එච්. එම්. එස්. බී. මඩවල මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1972 දෙසැම්බර් මස 09 වැනි දින සිට වාරියපොල ගම්බද උසාවියේ අංක 2890 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස මහනුවර දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ, නැගෙනහිර අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට. දින 15කින් පසු මෙම පත්වීම අවසාන වේ.

අංකය : පීඒඒ/12/57.

ඒ. එස්. යටවර මහතා 1972 අගෝස්තු මස 01 වැනි දින වාරියපොල ගම්බද උසාවියේ අංක ක්‍රි. පා. 2648 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස මහනුවර දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ නැගෙනහිර, අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 6/67.

එස්. රාජනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. එච්. කාරියප්පර් මහතා 1972 සැප්තැම්බර් මස 27 වැනි දින කල්මුනේ දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයි පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී එල්/එල්. 1/60.

අයි. එම්. ලියනගේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඩබ්ලිව්. ඕ. ඒ. ද සිල්වා මහතා 1972 නොවැම්බර් මස 22 වැනි දින බලපිටිය දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලැවිටි කෝරලේ සහ වැල්ලබඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 17/68.

ඒ. එම්. අයි. සහීඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වී. විල්වරාජා මහතා 1972 නොවැම්බර් මස 9 වැනි දින වවුනියා සහ යාපනය දිස්ත්‍රික්කයේ වවුනියා උතුරු සහ මුහුදුබඩ පත්තු ගම්බද උසාවි සභාපති සහ පූනාකාරි තුන්නුකායි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්. 12/66.

පී. ඩී. ආර්. වීජේතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. වීරතුංග මහතා 1972 නොවැම්බර් මස 3 වැනි දින මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තු කඩවත් සතර වැලිගම් කෝරලේ කඳුබොඩ පත්තු සහ ගඟබොඩ පත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්. 18/69.

බී. එස්. වික්‍රමසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, වී. යූ. කරවිට මහතා 1972 ඔක්තෝබර් මස 30 වැනි දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පලාත දකුණ උතුර නැගෙනහිර සහ බස්නාහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්. 13/69.

1972 ඔක්තෝබර් මස 31 වැනි දින එම්. බුලංකුලම මහතා නැවත නියමයක් කරනතුරු, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පලාත දකුණ උතුර නැගෙනහිර බස්නාහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දීය.

1-217/1

---

## 1973 අංක 3

### අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් පත්වීම අවසන් කිරීම

අංකය : සීජේකිව්/ඒ. 42/69.

ජේ. ඒ. හස්සනලි මහතා 1972 නොවැම්බර් 19 දින සිට දින 15ක කාල සීමාවක් සඳහා හෝ නැවත නියමයක් කරනතුරු, මොනරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ වැඩ බලන කාති වශයෙන් කරන ලද පත්වීම 1972 දෙසැම්බර් 1 දින සිට අවසන් වේ.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දී ය.

1-217/2

---

## 1973 අංක 4

### අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් කර ඇති ස්ථාන මාරුවීම් පත්වීම්

අංකය : සීආර්පී/ජේ. 6/63.

කේ. ජී. ජයසේන මහතා 1972 දෙසැම්බර් මස 15 වැනි දින සිට නැවත නියෝගයක් කරනතෙක් මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර, උඩපලාත, පස්බාගේ කෝරළේ, අඹගමුව කෝරලේ සහ යටිනුවර ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : සීආර්පී/ඩබ්ලිව්. 16/72.

ර. වෝ. ජ. වීරසූරිය මහතා 1972 දෙසැම්බර් මස 15 වැනි දින සිට නැවත නියෝගයක් කරනතෙක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පලාත, දකුණ, උතුර, බස්නාහිර සහ නැගෙනහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන්.

අංකය : සීආර්පී/එම්. 9/72.

උබේසේකර මාපා මහතා, 1972 දෙසැම්බර් මස 15 වැනි දින සිට නැවත නියෝගයක් කරනතෙක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ, නුවරඑළිය සහ වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන්.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
සී. 52, කැප්පෙටිපොල පාර,
කොළඹ 5 දී ය.

1-217/3

# වෙනත් පත්කිරීම් ආදිය

**1973 අංක 5**

අංකය : ඩී. 2/ආර්ර්සීවී/37.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—නිලධාරීන්ගේ උසස් කිරීම්**

1972 අගෝස්තු මස 1 වැනි දින සිට මිඩ්ෂිප්මන්වරුන් වශයෙන් —

ශිෂ්‍ය භට පී. ඒ. එස්. එම්. රාජරත්න
ශිෂ්‍ය භට පී. ජේ. විජේරත්න
ශිෂ්‍ය භට ඊ. එම්. කේ. ප්‍රනාන්දු
ශිෂ්‍ය භට එස්. පී. වීරසේකර
ශිෂ්‍ය භට ආර්. වැත්තෑව
ශිෂ්‍ය භට ඒ. එස්. එෆ්. මොහමඩ්
ශිෂ්‍ය භට එස්. පී. එෆ්. විජේරත්න
ශිෂ්‍ය භට ඩී. එම්. එස්. එම්. විජේවික්‍රම
ශිෂ්‍ය භට ඩබ්. කේ. කරන්නාගොඩ
ශිෂ්‍ය භට එල්. ඩී. ධර්මප්‍රිය
ශිෂ්‍ය භට ඩබ්. ආර්. ගුණනායගම්
ශිෂ්‍ය භට එස්. ශ්‍රී. වීරසිංහ
ශිෂ්‍ය භට එච්. එස්. රත්නකීර්ති
ශිෂ්‍ය භට සී. එන්. තුඩුවෙවත්ත
ශිෂ්‍ය භට එච්. ඒ. සොයිසා.

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ලේකම්.

1972 නොවැම්බර් 16 දින,
කොළඹ දී ය.

1-239

---

**1973 අංක 6**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති තුමා විසින් පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දන්වනු ලැබේ :—

ලංකා පරිපාලන සේවයේ III වෙනි පන්තියේ ජේ. වාහලවත්ත මහතා මාතර දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරි වශයෙන් ස්වකීය රාජකාරිවලට අතිරේකව, 1972 නොවැම්බර් මස 1 වෙනි දින සිට හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරි ලෙස වැඩ බැලීමට.

ලංකා පරිපාලන සේවයේ III වෙනි පන්තියේ ජේ. එක්ස්. ආර්. ඇන්තනිපිල්ලෙයි මහතා 1972.4.30 දින සිට 1972.6.9 දින දක්වා ටී. සැමුවෙල් තම්බයියා මහතා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ ස්වකීය රාජකාරි වලට අතිරේකව ඉඩම් සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ඩී. වී. සූරියආරච්චි මහතා 1972 සැප්තැම්බර් මස 16 වැනි දින සිට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, කළමනාකාර සේවා අංශයේ, ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා නිලධාරි තනතුරක වැඩ බැලීමට.

ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ එන්. ඒ. ඔබඩගේ මහතා 1972 නොවැම්බර් මස 1 වැනි දින සිට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, කළමණාකාර සේවා අංශයේ, ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා නිලධාරි තනතුරක වැඩ බැලීමට.

ලංකා පරිපාලන සේවයේ III පන්තියේ, කේ. යූ. කමල්ගොඩ මහතා 1972.8.1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පරිපාලන අභ්‍යාස ආයතනයේ අභ්‍යාස හා පර්යේෂණ ආශ්‍රිත නිලධාරි තනතුරක වැඩ බැලීමට.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඩී. ජී. පී. සෙනෙවිරත්න මහතා සිය රාජකාරිවලට අමතරව 1972 සැප්තැම්බර් මස 15 වැනි දින සිට 1972 ඔක්තෝබර් මස 9 වැනි දින දක්වා කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ කර්මාන්ත ව්‍යවස්ථා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 28 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ—7.

1–218/1

**1973 අංක 7**

ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව දැනුම් දෙනු ලැබේ :—

ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ඩී. එස්. වීරසිංහ මහතා 1972 ජූලි මස 21 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දිස්ත්‍රික් ඉඩම් නිලධාරියෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ එච්. ඇම්. අබේපාල මහතා, 1972 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමූපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ උප කොමසාරිස් වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ආර්. පී. පී. රාජපක්ෂ මහතා 1972 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමූපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ උප කොමසාරිස් වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ජේ. ඇස්. ඇම්. ද සිල්වා මහතා 1972 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමූපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ උප කොමසාරිස් වරයෙකු වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ V වන පන්තියේ එස්. සිවනාසන් මහතා 1970 පෙබරවාරි මස 22 වන දින සිට 1970 මැයි මස 30 වැනි දින දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිබල අමාත්‍යාංශයේ, සහකාර අධ්‍යක්ෂ (වැඩ සටහන්) ලෙස වැඩ බැලීමට හා 1970 මැයි මස 31 වන දින සිට නැවත නියමයක් කරන තුරු වාරි මාර්ග, විදුලිබල සහ මහාමාර්ග අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (වැඩ සටහන්) ලෙස වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ පළමුවැනි පන්තියේ එස්. වෙල්ලසිය මහතා 1972.05.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ එච්. ඩී. සිල්වා මහතා 1971.12.15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දිස්ත්‍රික් ඉඩම් නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ I වැනි පන්තියේ පී. එෆ්. මොහමඩ් මහතා, 1972 ජූලි මස 22 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දිස්ත්‍රික් ඉඩම් නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට.

කච්චේරි මිනින්දෝරු එස්. විජයසිංහම් මහතා නැවත නියමයක් කරන තුරු 1972 පෙබරවාරි මස 1 වැනි දින සිට දිස්ත්‍රික් ඉඩම් නිලධාරියකු වශයෙන් වැඩ බැලීමට.

බදුල්ල පාලන දිස්ත්‍රික්කයේ සොරණාතොට කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ සිරි ඒසුම්පෙරුම මහතා 1972.8. 21 වැනි දින සිට නැවත නියමයක් කරනු තුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව, බදුල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ මාහෝ කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එච්. එම්. එච්. බණ්ඩා මහතා 1972.7.1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

මන්නාරම පාලන දිස්ත්‍රික්කයේ මන්නාරම කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ කාසිපිල්ලෙයි තයාපරන් මහතා 1972.7.1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව මන්නාරම පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ කුරුණෑගල කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ අබේරත්න වනසිංහ මහතා 1972.7.1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ බිංගිරිය කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි, ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එස්. ජේ. විජේසේකර මහතා 72.7.1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ස්වකීය රාජකාරිවලට අතිරේකව කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

# ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 7/63.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**

16අ වගන්තිය යටතේ දැන්වීමයි

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත, 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, " අස්ගිරි මහා විහාරය හා අස්ගිරි මහා විහාරීය විධායක කාරක සංඝ සභාව " එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1972 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ 1.

1-241

---

**දැන්වීමයි**

වර්ෂ 1971 ජුනි මස 4 වැනි දින අංක 14,961 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදුව පසුව 1971 නොවැම්බර් මස 25 වැනි දින අංක 14,985/7 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද රජයේ ගණකාධිකාරී ව්‍යවස්ථාව, තවදුරටත් පහත සඳහන් පරිදි සංශෝධනය කරන මෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් නියෝග කර ඇත :—

**සංශෝධන**

1. 4(ඈ) ඡේදය සම්පූර්ණයෙන් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ :—

iv වැනි පන්තියේ පුරප්පාඩු වලින් සියයට 60 ක් පුරවනු ලබන්නේ දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන්ට පමණක් සීමාවූ, මෙහි පරිශිෂ්ඨයේ නිර්දිෂ්ඨ සීමිත තරඟ විභාගය කින්.

පහත සඳහන් ගණවලට අයත් නිලධාරීහු මේ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇත්තෝවෙති :—

(1) ඒකාබද්ධ සේවයක හෝ දෙපාර්තමේන්තුගත ශ්‍රේණියක හෝ රු. 3,000 ක (ඒකාබද්ධ) ආරම්භක වාර්ෂික වැටුපක් සහිත වැටුප් පරිමාවක සේවය කරන්නාවූ 10 වර්ෂයක රජයේ සේවයක් ඇත්තාවූ ද, මෙම පත්වීමෙහි ස්ථිර කර ඇත්තා වූ ද සේවකයෝ,

**හෝ**

(2) රජයේ සේවයේ සේවය කරන්නා වූ ද 5 වර්ෂයක සේවයක් සහිත, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්තා වූ සේවකයෝ,

**හෝ**

(3) රජයේ සේවයේ සේවය කරන්නාවූ ද, 5 වර්ෂයක සේවයක් සහිත සේවයෙහි ස්ථිර කරන ලද්දා වූ පහත සඳහන් අර්ධ වෘත්තීය සුදුසුකම් අතුරින් කවරක් වුවද ඇති සේවකයෝ,

(අ) ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම විභාගය,

(ආ) පිරිවැය සහ වැඩ ගණකාධිකාරී ආයතනයේ (අයි. සී. ඩබ්. ඒ.) (එක්සත් රාජ්‍යය) විභාගවල 1 වැනි 2 වැනි සහ 3 වැනි කොටස්,

(ඇ) සහතික ලත් සහ සංස්ථාගත ගණකාධිකාරී සංගමයේ (ඒ. සී. සී. ඒ.) (එක්සත් රාජ්‍යය) විභාගවල 1 වැනි 2 වැනි සහ 3 වැනි කොටස්,

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයේ ගණක විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා උපාධිය,

(ඉ) වරලත් ලේකම්වරුන්ගේ සංගමයේ මධ්‍යම විභාගය,

(ඊ) පිරිවැය සහ කාර්මික ගණකාධිකාරීන්ගේ සංගමයේ මධ්‍යම විභාගය.

**සංශෝධන**

2. පහත සඳහන් අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමෙන් 4, 'ආ' ඡේදය සංශෝධනය කරනු ලැබේ.

vi. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු වීම,

vii. වරලත් ලේකම්වරුන්ගේ සංගමයේ මධ්‍යම විභාගයෙන් සාමාර්ථයක් තිබීම,

viii. පිරිවැය සහ කාර්මික ගණකාධිකාරීන්ගේ සංගමයේ මධ්‍යම විභාගයෙන් සාමර්ථයක් තිබීම.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ දී ය.

1-1390

---

එල්. ඩී. බී. 33/54

**උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත**

5 වන වගන්තිය යටතේ නිවේදනය

(110 වන අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1935 සැප්තැම්බර් 20 වන දින අංක 8,146 දරණ ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පළකරනු ලැබ කලින් කල සංශෝධනය කරනු ලැබූ නිවේදනය, එහිවූ උප ලේඛනයෙහි " ලංව පළාත—බදුල්ල දිස්ත්‍රික්කය " යන ශීර්ෂය යටතේ—

(1) ගම්පහ කොට්ඨාශයට අදාල අංක 10 දරණ විෂය වෙනුවට මෙහි වූ " අ " උප ලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන් ; හා,

(2) එහි අංක 10 දරණ විෂයට ඉක්බිතිවම මෙහි වූ " ආ " උප ලේඛනයෙහි සඳහන් අංක 10අ දරණ අළුත් විෂය අන්තර්ගත කිරීමෙන්,

1973 පෙබරවාරි මස පළමු වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යවරයා.

1972 දෙසැම්බර් මස 6 දින,
කොළඹ දී ය.

**" අ " උපලේඛනය**

10. පහත සඳහන් ගම්වලින් සමන්විත වන ගම්පහ උතුරු කෝරළේ කොට්ඨාශය :—

| | |
|---|---|
| බලගල්ල | ඉලුක්වෙලගම |
| බණ්ඩාරවත්ත | කිදිගොඩ |
| දිඹුලන | කොහිලේ |
| ඇල්ලන්ද | රිටිකුඹුර |
| ගලහිටියාව | වැතලාව |
| ගලනිහේගම | වැවේගම |
| ගල්කොටුව | යාලගමුව |
| හත්කිඳ | යොම්පාන |

**" ආ " උපලේඛනය**

10 අ පහත සඳහන් ගම්වලින් සමන්විත වන ගම්පහ දකුණු කොරලේ කොට්ඨාශය :—

| | |
|---|---|
| බුල්ලියද්ද | මහකුඹුර |
| දියබෝකදුර | මල්වත්තේගම |
| ඇල්ලේගම | මැදිපොකුණ |
| ගන්දෙනිය | නින්දගන්ගම |
| හොරතොට | පනාගොඩගම |
| ඉඩමේගම | පිපියෙකුඹුර |
| කලගහඋල්ල | තලන්ගමුව |
| කරදේගම | උඩතුරේගම |

1-252

ඊසී/බී/ඇස්/78.

ඇල්. සී.බී. 277/40

### පුරාවස්තු ආඥාපනත

(188 වැනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සංස්කෘතික කටයුතු ඇමතිවරයා විසින් කරනු ලබන දැන්වීමයි.

ඇස්. ඇස්. කුලතිලක,
සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති.

1972.11.28 වැනි දින,
කොළඹ දීය.

### දැන්වීම

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළයේ උතුරු උඩපත්තුවේ කඳන්ගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයේ එක්නැලිගොඩ පිහිටි අ. ග. සී. 330 ලොට් අංක 11 ට අසුවන ඉඩමේ පිහිටි එක්නැලිගොඩ වලව්ව (188 වැනි අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ කාර්යයන් සඳහා ආරක්ෂිත ස්මාරකයක් විය යුතු බව ප්‍රකාශ කෙරෙන ආඥාවක් එකී ආඥාපනතේ 18 වැනි වගන්තිය යටතේ පැනවීමට අදහස් කරනු ලැබේ.

යථෝක්ත ආඥාව පැනවීම සම්බන්ධයෙන් වූ විරුද්ධතා 1973.2.6 වැනි දින හෝ ඊට පෙර කොළඹ, පුරාවිද්‍යා කොමසාරිස් වෙත ලැබෙන ලෙස එවිය යුතුය. ඒ සෑම විරුද්ධතාවක්ම ලියවිල්ලකින් විය යුතු අතර, ඊට හේතුවූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ඊට ඇතුළත් විය යුතුය.

1-125

---

### 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනත

#### 2 වන වගන්තිය යටතේ නියමය

1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනතෙහි 2 වන වගන්තියෙන් මා වෙත පැවැරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා විදේශ කටයුතු අමාත්‍ය ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම මෙම නියමයෙන් මෙහි උපලේඛනයෙහි නියමිත විවිධ වර්ගයන්ට ආධුනිකයින් වෙන් කරමි.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍ය.

1972 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹදීය.

#### උපලේඛනය

"අ" වර්ගය :—කර්මාන්ත ශිල්පී ආධුනිකයන්

1. වැද්දුම් කරුවන් (සාමාන්‍ය)
2. වැද්දුම් කරුවන් (නිර්මාණ)
3. වැද්දුම් කරුවන් (විවීම)
4. වැද්දුම් කරුවන් (කැපීම)
5. පෙදරේරුවන්
6. වඩුවන් (ගොඩනැගිලි)
7. වියන්නන්
8. මෝටර් යාන්ත්‍රික ශිල්පීන්
9. මෝටර් විදුලි ශිල්පීන්
10. යන්ත්‍ර ශිල්පීන්
11. කම්මල් කරුවන්
12. බෙලෙක් වැඩකරුවන් (ටින්කර්)
13. විදුලි ශිල්පීන් (නඩත්තු කිරීම්)
14. පෑස්සුම් කරුවන්
15. වාත්තු කරුවන්
16. පයිප්ප වැඩ කරුවන්

"ආ" වර්ගය—කාර්මික ශිල්පී ආධුනිකයින් :

1. සිවිල් ඉංජිනේරු ආධුනිකයන්
2. යාන්ත්‍රික (නිෂ්පාදන) ආධුනිකයන්
3. යාන්ත්‍රික (මෝටර්) ආධුනිකයන්
4. විදුලි (බලය) ආධුනිකයන්
5. විදුලි (ඉලෙක්ට්‍රොන් විද්‍යාව සහ විදුලි සංදේශ) ආධුනිකයන්
6. රසායනික ඉංජිනේරු ආධුනිකයන්

1-58

### මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1972 නොවැම්බර් මස 11 වැනි දින අංක 33/1 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සුද්ධ කරන ලද සුදු සීනි පිළිබඳ අංක සී. 518 දරණ ආහාර මිල නියෝගය, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ බව, (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් 14 දින,
කොළඹ දීය.

1-94

---

### මිල පාලන පනත

(2 වැනි අධිකාරය වන) අර්ථ නිරූපන ආඥා පනතේ 12 වැනි වගන්තිය සමග එක්ව කිවයුතු වූ (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ, 2 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින්,

(1) වෙල්ලසියා ෂන්මුගම් මහතා (ආහාර සහ විවිධ ද්‍රව්‍ය) සහකාර මිල පාලක වරයෙකු වශයෙන් දැරූ පත්වීම 1972 සැප්තැම්බර් මස 11 දින සිට අවලංගු කර,

(2) ඉහතකී දින සිට වලංගු වන පරිදි, අරබේ ගම්ලද්දලාගේ ප්‍රේමසිංහ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේකව මුළු දිවයින සඳහාම (ආහාර සහ විවිධ ද්‍රව්‍ය) සහකාර මිල පාලක වරයෙකු වශයෙන් පත් කර ඇත.

### කිරුම් හා මිණුම් ආඥා පනත

1971 අංක 7 දරණ කිරුම් හා මිණුම් (සංශෝධන) පනත මගින් සංශෝධිත කිරුම් හා මිණුම් ආඥාපනතෙහි 2 (1) (බී) දරණ ඡේදය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින්,

(1) වෙල්ලසියා ෂන්මුගම් මහතා කිරුම් හා මිණුම් අධිකාරි වරයෙකු වශයෙන් දැරූ පත්වීම 1972 සැප්තැම්බර් මස 11 දින සිට අවලංගු කර,

(2) ඉහත කී දින සිට වලංගු වන පරිදි අරබේ ගම්ලද්දලාගේ ප්‍රේමසිංහ මහතා ඔහුගේ වෙනත් රාජකාරී වලට අතිරේකව මුළු දිවයින සඳහාම කිරුම් හා මිණුම් අධිකාරීවරයෙකු වශයෙන් පත් කර ඇත.

විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමා විසින්,

(1) ගණකාධිකාරී සේවයේ iv පංතියේ වෙල්ලසියා ෂන්මුගම් මහතා ආනයන හා අපනයන පාලකවරයෙකු වශයෙන් දැරූ පත්වීම 1972 සැප්තැම්බර් මස 11 වැනි දින සිට අවලංගු කර,

(2) ඉහත කී දින සිට වලංගු වන පරිදි, අරබේ ගම්ලද්දලාගේ ප්‍රේමසිංහ මහතා ඔහුගේ වෙනත් රාජකාරී වලට අතිරේකව ආනයන හා අපනයන සහකාර පාලකවරයෙකු වශයෙන් සතුටින් පත් කරනු ලැබ සිටී.

ජයන්ත කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්.

1972 දෙසැම්බර් මස 19 දින,
කොළඹ දීය.

1-96

---

### 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

#### 49 ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජේ. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1972 දෙසැම්බර් මස 16 දින
කොළඹ දීය.
සාපාශා./අත්පු/73

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ නාවල ග්‍රාමසේවක කොට්ඨාශයේ නාවල කිරි මණ්ඩල පාරේ පිහිටි පරංගියාකුඹුර නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මයිම් ඇති අක්කර 6 ක පමණ ඉඩම් කොටසක්.

උතුරට : කිරිමණ්ඩල මාවත ;

නැගෙනහිරට : දෙල්ගහවත්ත සහ පරංගියවත්ත ඉඩම ;

දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ;

බස්නාහිරට : රජයේ ඉඩම.

1-18

---

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත**

නිවාස හා ගොඩනැගිලි පිළිබඳ ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ, මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම එම පනතේ 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්පත් කරගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති

1972 දෙසැම්බර් 16 දින,
කොළඹ දීය.

උපලේඛනය

දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ ගගබඩපත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ ඌරල ග්‍රාමසේවක වසමේ පිහිටි පහත සඳහන් අයුරු මායිම්ව ඇති රූඩ් 2 පර්චස් 10 විශාල කොනේගොඩ කන්ද නමැති ඉඩම.

උතුරට : ගාල්ල ඇතුමලේ බස්පාර ;

නැගෙනහිරට : වික්ලෝ හිල් වතුයාය ;

දකුණට : වික්ලෝ හිල් වතුයාය ;

බස්නාහිරට : වික්ලෝ හිල් වතුයාය.

1-3

---

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත**

49 ඡේදය යටතේ සහතිකය

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1972 දෙසැම්බර් 16 දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාතේ ,නුගේගොඩ ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ බොරලැස්ගමුව ග්‍රාම සේවක වසමේ කටුවාවල නැමති ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත ,නැමති ඉඩමෙන් අක්කර 3 ක පමණ ඉඩම් කොටසක්.

උතුරට : කේ. පුංචිහාමිගේ ඉඩම සහ අඹගහවත්තේ කොටසක් ;

නැගෙණහිරට : කටුවාවල ගම්සභා පාර ;

දකුණට : අඹගහවත්තේ කොටසක් ;

බස්නාහිරට : අඹගහවත්ත නැමති ඉඩම.

1-56

ආඥා අංක 11.

**1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පනතේ 27 වැනි වගන්තිය යටතේ ආඥාවයි**

1970 අංක 14 දරණ මහවැලි සංවර්ධන මණ්ඩල පනතේ 27 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, වාරිමාර්ග විදුලි බලය හා මහාමාර්ග ඇමති, මෛත්‍රීපාල සේනානායක වන මම මහ වැලි සංවර්ධන මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද, පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම ආඥාව මගින් අනුමත කරමි.

මෛත්‍රීපාල සේනානායක,
වාරිමාර්ග විදුලිබලය හා මහා මාර්ග ඇමති.

යොමු අංක : වාරි. වි.ම./ලේ. :—ඩබ්/එල්ඩී/එල්ඒ/7 72.
යොමු අංක : ම. ස. ම.—ඊඑන්ජී/පීඑල්/9—සී.
1972 දෙසැම්බර් මස 13 දින,
කොළඹදීය.

උපලේඛනය

ශ්‍රී ලංකා ජන රජයේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාරුකොන ග්‍රාමසේවක වසමට අයිති රයිතලාවෙල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්. 0, රූ. 3 ප. 4 පමණ වූ ඉඩම් කැබලි පහට මායිම් :—

ලොට් අංක 9ඒ—ඊරිකොස්ගහමල වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 38.4.

උතුරට : ප්‍රසිද්ධ පාර රක්ෂිත ප්‍රදේශය ;
දකුණට : අත්පත් කර ගන්නා ලද ලොට් අංක 11 ;
නැගෙනහිරට : අත්පත් කර ගන්නා ලද ලොට් අංක 9 සහ 10 ;
බස්නාහිරට : එම ඉඩමේ කොටසක්.

ලොට් අංක 7 ඒ—දොඹකොටුව—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0, පර්. 6.4.
උතුරට : දුන්ඔය වලකුඹුර වත්ත ;
දකුණට : ගම්සභා පාර ;
නැගෙනහිරට : එම ඉඩමේ කොටසක් ;
බස්නාහිරට : අත්පත් කර ගන්නා ලද ලොට් අංක 7.

ලොට් අංක 7 බී—ඊරිගයගහ කොටුව—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 20.4.

උතුරට : ගම්සභා පාර ;
දකුණට : ඇල ;
නැගෙනහිරට : දුන්ඔය ;
බස්නාහිරට : එම ඉඩමේ කොටසක්.

ලොට් අංක 28 ඒ—වැඩකාරසිලේ වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 20.4.

උතුරට : අත්පත් කර ගන්නා ලද ලොට් අංක 28 ;
දකුණට : ගම්සභා පාර ;
නැගෙනහිරට : අත්පත් කර ගන්නා ලද ලොට් අංක 28 ;
බස්නාහිරට : එම ඉඩමේ කොටසක්.

ලොට් අංක 34 ඒ—පරණ වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 38.4.

උතුරට : ගම්සභා පාර ;
දකුණට : අත්පත් කර ගන්නා ලද අංක 34 ;
නැගෙනහිරට : එම ඉඩමේ කොටසක් ;
බස්නාහිරට : ලොට් අංක 34.

හිමිකම් කියන අය : එච්. ඇම්. මොහොමඩ් කාසියම්, යූ. ජී. සුවනේරිස්, ඇම්. බී. මුහන්දිරම්, ඇම්. බී. මැක් අජ්පු සහ ඇන්. ඒ. කපූර්.

1-97

---

එල්.ඩී.බී. 2/71.

**1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත 7 (2) වැනි වගන්තිය යටතේ වූ නියෝගය**

1968 අංක 32 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ සාදා 1972 පෙබරවාරි 18 වන දින අංක 14,998 දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබ, 1972 නොවැම්බර් මස 28 වන දින අංක 35/4 දරන ගැසට් පත්‍රයේ අවසාන වරට පළ කරන ලද නියෝගයෙන් සංශෝධිත නියෝගයෙහි, "1972 දෙසැම්බර් මස 30 වනදාසින් අවසන් වන" යන යෙදුම වෙනුවට, 1973 ජනවාරි මස 31 වනදාසින් අවසන් වන" යන යෙදුම ආදේශ කිරීමෙන් එම නියෝගය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය හා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

1972 දෙසැම්බර් මස 28 දින,
කොළඹදී ය.

1-266

ඉඩම් සංවර්ධන ආඥාපනත (320 වැනි පරිච්ඡෙදය)

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6 (1) වැනි ඡේදය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා විසින් එච්. ජයසූරිය මහතා ඔහුගේ රාජකාරිවලට අතිරේකව අම්පාරේ දිස්ත්‍රික්කයේ ඉඩම් නිලධාරියෙකු ලෙස 1972.1.1 දින සිට පත් කර ඇත.

එස්. බී. සේනානායක,
අතිරේක ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

කොළඹ,
1972.11.27.

1-19

## මිළ පාලන දැන්වීම්

අංක : පී. ඇල්. 1/72 දරණ මිල ආඥාව | එළුමස්.

### මිල පාලන පනත

### ආඥාව

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර) තැන්පත්, ෂර්ලි රෙජිනෝල්ඩ් විලියම් පෙරේරා අමරසිංහ වන මම (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වෙනි වගන්තිය සමග කියවෙන 3(2) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල අනුව:

(1) 1970 ජූලි මස 19 වෙනි දින අංක 14,915/3 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක පී.ඇල්. 1/70 සහ 1970 ජූලි මස 16 වෙනි දින දරණ ආහාර මිල නියෝගය මේ දැන් සිටම බලපැවැත්වෙන පරිදි මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2, 3 වෙනි තීරයන්හි සඳහන් මිළ, එළුමස් රාත්තලක උපරිම මිළ වශයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ග වලට සහ ශ්‍රේණි වලට අයත් එළුමස්, එම උපලේඛනයේම 1 වැනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශය තුල එකී මිලට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) "එළුමස්" යනුවෙන් හැඟවෙන්නේ බැටළුවකුගේ හෝ හෝ එළුවෙකුගේ මාංශයි. බොකු බඩවැල් ආදී සියලු ආකාර ඉවත් කරනු ලබන දැය මීට ඇතුලත් නොවේ.

(ආ) බැටළුවෙකුගේ හෝ එළුවෙකුගේ සිරුර විකිණීම සඳහා මස් මඩුවේ පිළියෙල කොට ඇති පරිදි (එනම් : හිස, හම, බොකු බඩවැල්, කුර සහ වෙනත් සියළු විදියේ සාමාන්‍ය යෙන් ඉවත් කරනු ලබන දැය අතහැර) විකුණන විට "තනිබර" අනුව විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) කටු සහිත එළුමස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට 25කට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි.

(5) මෙම නියෝගයේ උපරිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසියම් තැනක, වාහනයක හෝ යාත්‍රාවක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ, උපලේඛනයේ සඳහන් වර්ග වලට සහ ශ්‍රේණිවලට අයත් එළුමස් ඇති සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ සඳහන් වර්ග වලට සහ ශ්‍රේණි වලට අයත් එළුමස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩි මිල ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ, වාහනයේ හෝ යාත්‍රාවේ පැහැදිලිව පෙනෙන ලෙස තැබිය යුතුය.

(6) ඉවත් කරනු ලබන දැය සමග එළුමස් එකම ගනුදෙනුවකදී විකුණනු ලබනවිට එළුමස්, ඉවත් කරනු ලබන දෙයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි.

(7) සෑම වෙළෙන්දෙකුම එළුමස් විකුණන කල්හි, එළුමස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකිවනසේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(8) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ග වලට සහ ශ්‍රේණි වලට අයත් එළුමස් විකුණන සෑම වෙළෙන්දෙකුම, එළුමස් ලබාගන්නෙකු ඉල්ලා සිටිනවිට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය;

(ආ) විකුණූ එළුමස් ප්‍රමාණය (බර);

(ඇ) විකුණූ එළුමස් වල විස්තර ; සහ

(ඈ) විකුණූ මස් ප්‍රමාණයට ගෙවූ මුදල ද

සඳහන් විය යුතුයි.

(9) මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුල කිසිවකු උපලේඛනයේ සඳහන් දැය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කලවම් කොට නොවිකිණිය යුතුයි.

(10) උපලේඛනයෙහි සඳහන් දැය විකුණන කල්හි එකී දැය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛන යෙහි 2 සහ 3 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිළෙහි අන්තර්ගත වේ.

(11) මෙම නියෝගයෙහි කාර්යයන් සඳහා, "රාත්තල" හෙවත් "රා" යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1972 නොවැම්බර් මස 30 දින පෙරවරු 9ට පොලොන්නරුව දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

එස්. ආර්. ඩබ්ලිව්. පී. අමරසිංහ,
සහකාර මිල පාලක (ආහාර) පොලොන්නරුව
දිස්ත්‍රික්කය.

### උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| | කටු රහිත එළුමස් රාත්තලක් | කටු සහිත එළුමස් රාත්තලක් |
| ප්‍රදේශය | විකිණිය හැකි උපරිම මිළ | විකිණිය හැකි උපරිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය ... | 2 75 ... | 2 60 |

සටහන.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ ගණන් වේ. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ඒ ද්‍රව්‍ය විකිණීමට නොහැකිය.

1–43

---

අංක : පී. ඇල්. 2/72 දරණ මිල ආඥාව | හරක් මස්

### මිල පාලන පනත

### ආඥාව

පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල පාලක (ආහාර) තැන්පත්, ෂර්ලි රෙජිනෝල්ඩ් විලියම් පෙරේරා අමරසිංහ වන මම (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 වෙනි වගන්තිය සමග කියවෙන 3(2) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල අනුව:

(1) 1970 ජූලි මස 19 වෙනි දින අංක 14,915/3 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක පී. ඇල්. 2/70 සහ 1970 ජූලි මස 16 වෙනි දින දරණ ආහාර මිල නියෝගය මේ දැන් සිටම බලපැවැත්වෙන පරිදි මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2, 3 වෙනි තීරයන්හි සඳහන් මිළ, හරක් මස් රාත්තලක උපරිම මිල වශයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ග වලට සහ ශ්‍රේණි වලට අයත් හරක් මස්, එම උපලේඛනයේම 1 වැනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශය තුල එකී මිලට වැඩියෙන් නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) "හරක් මස්" යන පාඨයට එළ හරක් හා මීහරක් මාංශ ඇතුලත් වන අතර, මාංශාවශේෂ කිසිවක් ඇතුලත් නොවේ.

(ආ) සතකුගේ මළකුණ විකිණීම සඳහා මස් මඩුවේදී පිළියෙල කොට ඇති අයුරින් (එනම්, හිස, හම, බඩවැල්, මාංශාව ශේෂ, කුර හා සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන කොටස් හැර) විකුණන විට එය තනිබර අනුව කෙරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුයි.

(4) කටු සහිත හරක් මස් විකිණීමේදී මේ සමග විකුණූ කටුවල බර විකුණූ මුළු බරින් සියයට 25 කට නොවැඩි විය යුතුයි.

(5) මෙහි වූ උපලේඛනයේ 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුලත වූ යම් ස්ථානයක ඒ උපලේඛනයේ සඳහන් වර්ගයට සහ ශ්‍රේණි යට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වර්ගයේ හෝ ශ්‍රේණියේ හරක් මස් සම්බන්ධ යෙන් මේ නියෝගයෙන් නියමිත උපරිම මිළ සඳහන් කළ යුතු දැන්වීමක් එකී ස්ථානයේ, හැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශණය කළ යුතුයි.

(6) හරක් මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශණය කළ යුත්තේ ඒ සඳහා වෙන් කොට ඇති වෙළඳ පිල්වල පමණක් වූ අතර, එම වෙළඳ පිල්වල වෙනයම් වර්ගයක හෝ ශ්‍රේණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම හෝ නොකළ යුතුයි.

(7) මෙහි වූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුලත වූ යම් ස්ථානයක ඒ උපලේඛනයෙහි සඳහන් වර්ගවලට සහ ශ්‍රේණි වලට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වෙළඳ පිලෙහි එම වර්ගයට සහ ශ්‍රේණියට අයත් හරක් මස් පමණක් විකුණන බවට ඒ හරක් මස් විකුණන වෙළඳපිළෙහි පැහැදිලිව පෙනෙන ලෙස දැන්වීමක් ප්‍රදර්ශනය කළ යුතුයි.

(8) එක් ගණුදෙනුවක් කිරීමේදී කටු රහිත හරක් මස් හෝ කටු සහිත හරක් මස් හෝ සමහ මාංශාවශේෂ විකුණනු ලබන විට කටු රහිත හරක් මස් හෝ කටු සහිත හරක් මස් හෝ මාංශාවශේෂ වලින් වෙන් කොට කිරා විකිණිය යුතුය.

(9) හරක් මස් විකුණනු ලබන සෑම තැනැත්තකු විසින්ම, යම් කෙනෙකු විසින් හරක් මස් ඉල්ලූ විට මාංශාවශේෂයෙන් තොර හරක් මස් පමණක් විකිණිය යුතුයි.

(10) සෑම වෙළෙන්දෙකුම හරක් මස් විකුණන කල්හි, හරක් මස් ගැණුම් කරු විසින් මිළට ගන්නා හරක් මස් ප්‍රමාණයෙහි සැබෑ බර පහසුවෙන් බලා ගැණීමට හැකි වන සේ තම තරාදිය හෝ තරාදි තැබිය යුතුයි.

(11) මෙහි වූ උප ලේඛනයෙහි සඳහන් වර්ගයේ සහ ශ්‍රේණියේ හරක් මස් විකුණන සෑම වෙළෙන්දෙකුම, හරක් මස් ගැණුම් කරු විසින් ඉල්ලා සිටි විට පහත සඳහන් කරුණු දක්වෙන කුවිතාන්සියක් ඔහුට දිය යුතුයි :—

(අ) විකුණූ දිනය;

(ආ) විකුණූ හරක් මස් ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ හරක් මස් වර්ගය ; හා

(ඈ) විකුණූ හරක් මස් ප්‍රමාණයට ගෙවූ මිළ

සඳහන්විය යුතුයි.

(12) මෙම නියෝගයෙන් උපරිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුල කිසිවකු උපලේඛනයේ සඳහන් දෑය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කවලම් කොට නොවිකිණිය යුතුයි.

(13) උපලේඛනයෙහි සඳහන් දෑය විකුණන කල්හි එකී දෑය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙහොත් එය එම උපලේඛනයෙහි 2 වෙනි සහ 3 වෙනි තීරයන්හි සඳහන් වැඩිම මිලෙහි අන්තර්ගත වේ.

(14) මෙම නියෝගයෙහි කාර්‍යයන් සඳහා, "රාත්තල" හෙවත් "රා" යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

1972 නොවැම්බර් මස 30 දින පෙරවරු 9 ට පොලොන්නරුව දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

එස්. ආර්. ඩබ්ලිව්. පී අමරසිංහ,
සහකාර මිල පාලක (ආහාර) පොලොන්නරුව දිස්ත්‍රික්කය.

උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>කටු රහිත හරක්මස් රාත්තලක් විකිණිය හැකි උපරිම මිළ<br>රු. ශ. | | 3 වෙනි තීරය<br>කටු සහිත හරක්මස් රාත්තලක් විකිණිය හැකි උපරිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| පොලොන්නරුව පාලන දිස්ත්‍රික්කය ... | 1 10 | ... | 1 0 |

සටහන.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ ගණන්වේ. මේ මිළගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණීමට නොහැක.

1–43/2

---

## ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

### 1967/68 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ කළමනාකාර මණ්ඩලයේ පාලන වාර්තාව

**කළමනාකාරිත්වය.**—සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල, මුදල් අමාත්‍යාංශය යටතේ පැවතුනි. 1946 සහ 1947 ලංකා (ආණ්ඩුක්‍රම සහ ස්වාධීනතා) රාජ සභා ආඥාවේ 46 (4) වැනි වගන්තිය යටතේ, 1970 ජූනි මස 2 වැනි දින අංක 14,908/6 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය මගින් අරමුදලේ පාලනය 1970 මැයි මස 31 වැනි දින සිට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට පවරා ඇත. එම පැවරීම හේතුකොට කළමනාකාර මණ්ඩලයේ සභාපති ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ පත් කරනු ලැබ ඇත.

සමාලෝචිත වර්ෂය තුළදී, පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කළමනාකාර මණ්ඩලයකින් අරමුදල පාලනය කරනු ලැබී ය :—

(1) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (සභාපති).

(2) සොලිසිටර් ජනරාල්.

(3) කම්කරු කොමසාරිස්.

(4) නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ.

(5) ඩී. සී. ලේල්වල මහතා.

**කාර්ය මණ්ඩලය.**—49 දෙනෙකුගෙන් යුක්ත කාර්ය මණ්ඩලයේ වෙනස්වීමක් වර්ෂය තුළදී සිදුවී නොමැත.

**දායක සංඛ්‍යාව.**—1968 සැප්තැම්බර් 30 දිනට දායක සංඛ්‍යාව දළ වශයෙන් 76,000 ක් විය.

**අනුමතික ප්‍රදාන.**—වර්ෂය තුළදී ප්‍රදාන 7,572 ක් අනුමත කර ඇති අතර ඉකුත් වර්ෂයේ මීට අනුරූප සංඛ්‍යාව 7,936 කි. අනුමතික ප්‍රදානයන්, ආඥා පනතේ අදාළ වගන්ති යටතේ වර්ග කරනු ලැබ පහත දක්වා ඇත :—

| | |
|---|---|
| 14 වෙනි වගන්තිය—මියයාම, විශ්‍රාමයාම, තනතුරු අහෝසි කිරීම යනාදි ... ... ... | 563 |
| 16 වෙනි වගන්තිය—සේවයෙන් නෙරපීම් හා සේවය හැරයාම ... ... ... ... | 194 |
| 20 වෙනි වගන්තිය—විශ්‍රාම වැටුප් සහිත සේවයට පත්වීම ... ... ... ... | 6,573 |
| —වැරදී අය කිරීම ... ... ... ... ... | 242 |
| | 7,572 |

**පාලන වියදම්.**—සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලේ කළමනාකාරිත්වය හා පාලන වියදම් වෙනුවෙන් වැය කළ මුදල රු. 2,30,557 කි. ඉකුත් වර්ෂයේ මීට අනුරූප වියදම රු. 2,48,714 ක් විය. මෙම වියදම් අරමුදල මගින් දරනු ලැබේ.

**ගිණුම්.**—විගණනය කර ඇත්තාවූ 1968 සැප්තැම්බර් 30 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුමත්, ආදයම් විසර්ජන ගිණුමත් එම දිනට වූ ශේෂ පත්‍රයත් එම ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව සහ ඒ සම්බන්ධ කළමනාකාර මණ්ඩලයේ නිරීක්ෂණ ද මෙම වාර්තාවේ "අ" පරිශිෂ්ටය ලෙස පළ කර ඇත.

**පොලී ගෙවීම්.**—මෙම වර්ෂය වෙනුවෙන් දායකයින්ගේ ගිණුම් සඳහා වර්ෂයකට සියයට $3\frac{7}{8}$ ක පොලියක් ගෙවීම කළමනාකාර මණ්ඩලය අනුමත කර ඇත. ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවීම සඳහා අනුමත කළ ප්‍රමාණය ද මෙයම වේ.

ඩබ්ලිව්. චන්ද්‍රසේන,
ලේකම්.

ලෙනාඩ් පනම්බලන,
සභාපති.

කොළඹ,
1972 නොවැම්බර් මස 13 වෙනි දින.

## 'අ' පරිශිෂ්ඨය

### රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

### 1968 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

**ලැබීම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1967.10.01 දින හා.නි.ලේ. වෙත තිබූ මුදල ... ... | | 44,63,821 56 |
| අනිවාර්ය දයක මුදල් ... | 19,01,994 93 | |
| ස්වේච්ඡා දයක මුදල්... ... | 41,050 68 | |
| | | 19,43,045 61 |
| රජයේ දයක මුදල ... ... | | 34,50,000 0 |
| ආයෝජන පොළී ... ... | | 25,38,542 02 |
| සදෙස් බැර ... ... | | 61,918 57 |
| | | 1,24,57,327 76 |

**ගෙවීම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| රජයේ ණය මුදලේ ආයෝජනය ... | | 30,00,000 0 |
| දයකයින්ට ගෙවූ ප්‍රදන— | | |
| අනිවාර්ය දයක මුදල් ... | 21,75,771 95 | |
| ස්වේච්ඡා දයක මුදල් ... | 32,754 94 | |
| ප්‍රසාද මුදල් ... ... | 2,72,947 92 | |
| | | 24,81,474 81 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ දයකයනට අහිමි ප්‍රසාද මුදල් ... | | 39,21,343 20 |
| සදෙස් හර හා හැලපීම් ... | | 58,123 74 |
| 1968.09.30 දින හා.නි.ලේ. වෙත ඉතිරිය | | 29,96,386 01 |
| | | 1,24,57,327 76 |

### 1968 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් විසර්ජන ගිණුම

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| වර්ෂයකට සියයට 3½ බැගින් ගිණුම් සඳහා පොළී— | | |
| අනිවාර්ය දයක මුදල් ... | 8,23,221 46 | |
| ස්වේච්ඡා දයක මුදල් ... | 9,803 22 | |
| ප්‍රසාද මුදල් ... ... | 13,03,580 66 | |
| | | 21,36,605 34 |
| ආයතන වියදම 1967/68 ... | | 2,02,455 67 |
| ගණන් පරීක්ෂණ ගාස්තු 1967/68 ... | | 28,101 11 |
| ලී බඩු යනාදිය වෙනුවෙන් ක්ෂයවීම් ... | | 1,904 70 |
| ඉදිරියට ගෙන ගිය ශේෂය ... | | 1,02,750 12 |
| | | 24,71,816 94 |

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය ... | | 79,921 32 |
| ආයෝජන පොළී වර්ෂය තුළ ලැබුණ ... | 25,38,542 02 | |
| අඩු කළා : පසුගිය වර්ෂය වෙනුවෙන් ... | 7,98,813 75 | |
| | 17,39,728 27 | |
| එකතු කළා : වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු පොළිය ... ... | 6,52,167 35 | |
| | | 23,91,895 62 |
| | | 24,71,816 94 |

### 1968 සැප්තැම්බර් මස 30 වෙනි දිනට වූ ශේෂ පත්‍රය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| පොළී ඇතුළුව දයකයින්ගේ ගිණුම්වල බැරට ඇති මුදල්— | | |
| අනිවාර්ය දයක මුදල් ... | 2,44,25,750 28 | |
| ස්වේච්ඡා දයක මුදල් ... | 2,95,643 26 | |
| ප්‍රසාද මුදල් ... ... | 4,26,27,198 91 | |
| | | 6,73,48,592 45 |
| ආයෝජන සංචිතය ... | | 9,112 50 |
| ආදයම් විසර්ජන ගිණුම ... | | 1,02,750 12 |
| **විවිධ ණය හිමියන්** | | |
| හා.නි.ලේ. ආයතන වියදම 67/68 ... | 2,02,455 67 | |
| ගණන් පරීක්ෂණ ගාස්තුව 67/68 ... | 28,101 11 | |
| ආයතන වියදම 66/67 ... | 2,25,683 22 | |
| ගණන් පරීක්ෂණ ගාස්තුව 66/67 ... | 22,320 27 | |
| ගණන් පරීක්ෂණ ගාස්තුව 65/66 ... | 23,031 78 | |
| | | 5,01,592 05 |
| සදෙස් බැර ... ... | | 9,237 79 |
| | | 6,79,71,284 91 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| ගත් මිලට ආයෝජන (වෙළඳ අගය රු. 5,92,82,112.30) | | 6,43,05,589 25 |
| ගත් මිලට ලී බඩු සහ උපකරණ ... | 23,507 70 | |
| අඩු කළා : ක්ෂය ප්‍රතිපාදනය ... | 6,365 40 | |
| | | 17,142 30 |
| **විවිධ ණයගැතියන්** | | |
| රාජ්‍ය ණය අධිකාරී ... | | 6,52,167 35 |
| භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ... | | 29,96,386 01 |
| | | 6,79,71,284 91 |

ඩබ්ලිව්. චන්ද්‍රසේන,
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පාලක මණ්ඩලයේ ලේකම්.

ලෙනඩ් පනම්බලන,
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ හා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පාලක මණ්ඩලයේ සභාපති.

1972 ජනවාරි මස 31 වෙනි දින,
කොළඹ.

1968 සැප්තැම්බර් 30 වෙනි දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ ගිණුම්, එම අරමුදල පිළිබඳ ආඥා පනතේ (පරිච්ඡේද 434) 24 (1) වගන්තිය ප්‍රකාර මා විසින් පරීක්ෂාවට භාජනය කරන ලදී. මීට යාකර ඇති අංක : ඔ–3/පී.ඇස්.පී.ඇෆ්. (67/68) හා 1972 මැයි 16 දින දරණ වාර්තාවේ අන්තර්ගත නිරීක්ෂණයන්ට යටත්වූ විට, මෙම අරමුදලේ ශේෂ පත්‍රය හා ඒ හා සම්බන්ධිත මුදල් ප්‍රකාශයන් 1968 සැප්තැම්බර් මස 30 වන දිනට එම අරමුදලේ මුදල් තත්වය හා එදිනෙන් අවසන් වූ වර්ෂය තුළ එය පවත්වා ගෙන යාමෙන් ලත් ප්‍රතිඵල සාධාරණ ලෙස පිළිබිඹු වන අන්දමින් සකස් කොට ඇති බව මගේ අදහසයි.

1972 මැයි මස 16 වැනි දින,
කොළඹ 7; රජයේ ගණන් පරීක්ෂණ කාර්යාලයේ දී ය.
1–107

සී. සිවපාකසුන්දරම්,
ඔඩිටර් ජනරාල් වෙනුවට.

‘ අ ’ පරිශිෂ්ඨය

**1968.9.30 දිනට ආයෝජන—රා.සේ.අ. අරමුදල**

| | වත්කම | | | | | මතුපිට වත්කම් | | | වෙළඳ අගය | | | ගත් මිල | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | රු. | ශ. | | රු. | ශ. | | රු. | ශ. |
| 1. | 3½% ජාතික ණය මුදල | | 1964/69 | ... | ... | 7,68,000 | 0 | ... | 7,67,232 | 0 | ... | 7,39,948 | 75 |
| 2. | 3% ජාතික සංවර්ධන ණය මුදල | | 1965/70 | ... | ... | 20,40,500 | 0 | ... | 20,13,973 | 50 | ... | 20,04,140 | 50 |
| 3. | 3% ජයග්‍රහණ ණය මුදල | | 1965/70 | ... | ... | 1,00,000 | 0 | ... | 98,800 | 0 | ... | 90,000 | 0 |
| 4. | 3% ලංකා රජයේ ණය මුදල | | 1966/71 | ... | ... | 10,00,000 | 0 | ... | 9,79,000 | 0 | ... | 10,00,000 | 0 |
| 5. | 3% ලංකා රජයේ ණය මුදල | | 1969/72 | ... | ... | 20,00,000 | 0 | ... | 19,44,000 | 0 | ... | 20,00,000 | 0 |
| 6. | 2½% ජාතික සංවර්ධන ණය මුදල | | 1967/72 | ... | ... | 20,00,000 | 0 | ... | 19,06,000 | 0 | ... | 20,00,000 | 0 |
| 7. | 3% ශ්‍රී ලංකා ණය මුදල | | 1969/74 | ... | ... | 12,50,000 | 0 | ... | 12,01,250 | 0 | ... | 12,50 000 | 0 |
| 8. | 3% ලංකා රජයේ ණය මුදල | | 1972/77 | ... | ... | 15,00,000 | 0 | ... | 13,57,500 | 0 | ... | 15,00,000 | 0 |
| 9. | 3¼% එම | | 1973/77 | ... | ... | 15,00,000 | 0 | ... | 13,86,000 | 0 | ... | 15,00,000 | 0 |
| 10. | 3% එම | | 1973/78 | ... | ... | 12,50,000 | 0 | ... | 11,21,250 | 0 | ... | 12,50,000 | 0 |
| 11. | 3¼% එම | | 1975/79 | ... | ... | 20,00,000 | 0 | ... | 18,18,000 | 0 | ... | 20,00,000 | 0 |
| 12. | 3¼% එම | (බී) | 1975/79 | ... | ... | 20,00,000 | 0 | ... | 18,12,000 | 0 | ... | 20,00,000 | 0 |
| 13. | 3½% එම | | 1976/80 | ... | ... | 40,00,000 | 0 | ... | 36,56,000 | 0 | ... | 40,00,000 | 0 |
| 14. | 3¼% එම | | 1975/80 | ... | ... | 10,00,000 | 0 | ... | 8,82,000 | 0 | ... | 10,00,000 | 0 |
| 15. | 3¼% එම | | 1976/81 | ... | ... | 10,00,000 | 0 | ... | 8,80,000 | 0 | ... | 10,00,000 | 0 |
| 16. | 4¼% එම | | 1981/85 | ... | ... | 22,80,000 | 0 | ... | 21,04,440 | 0 | ... | 22,80,000 | 0 |
| 17. | 4¼% එම | (බී) | 1981/85 | ... | ... | 17,20,000 | 0 | ... | 15,85,840 | 0 | ... | 17,20,000 | 0 |
| 18. | 4¼% එම | | 1982/86 | ... | ... | 10,00,000 | 0 | ... | 9,20,000 | 0 | ... | 10,00,000 | 0 |
| 19. | 4¼% එම | (ඩී) | 1982/86 | ... | ... | 20,00,000 | 0 | ... | 18,30,000 | 0 | ... | 20,00,000 | 0 |
| 20. | 4¼% එම | (ඊ) | 1982/86 | ... | ... | 12,50,000 | 0 | ... | 11,41,250 | 0 | ... | 12,50,000 | 0 |
| 21. | 4¼% එම | (ජී) | 1982/86 | ... | ... | 20,00,000 | 0 | ... | 18,24,000 | 0 | ... | 20,00,000 | 0 |
| 22. | 4¼% එම | (එච්) | 1982/86 | ... | ... | 20,00,000 | 0 | ... | 18,20,000 | 0 | ... | 20,00,000 | 0 |
| 23. | 4¼% එම | | 1983/87 | ... | ... | 5,00,000 | 0 | ... | 4,53,500 | 0 | ... | 5,00,000 | 0 |
| 24. | 4¼% එම | (බී) | 1983/87 | ... | ... | 12,50,000 | 0 | ... | 11,32,500 | 0 | ... | 12,50,000 | 0 |
| 25. | 4¼% එම | (එෆ්) | 1983/87 | ... | ... | 30,00,000 | 0 | ... | 27,00,000 | 0 | ... | 30,00,000 | 0 |
| 26. | 4¼% එම | (සී) | 1984/88 | ... | ... | 40,00,000 | 0 | ... | 35,76,000 | 0 | ... | 40,00,000 | 0 |
| 27. | 4½% එම | (ඊ) | 1984/88 | ... | ... | 40,00,000 | 0 | ... | 36,64,000 | 0 | ... | 40,00,000 | 0 |
| 28. | 4½% එම | (එෆ්) | 1985/89 | ... | ... | 5,00,000 | 0 | ... | 4,53,500 | 0 | ... | 5,00,000 | 0 |
| 29. | 4½% එම | (බී) | 1986/90 | ... | ... | 40,00,000 | 0 | ... | 36,08,000 | 0 | ... | 40,00,000 | 0 |
| 30. | 4½% එම | (සී) | 1986/90 | ... | ... | 20,00,000 | 0 | ... | 18,02,000 | 0 | ... | 20,00,000 | 0 |
| 31. | 3% ජාතික නිවාස ණයකරය | | 1969/71 | ... | ... | 10,00,000 | 0 | ... | 9,85,000 | 0 | ... | 10,00,000 | 0 |
| 32. | 3¼% එම | | 1970/72 | ... | ... | 10,00,000 | 0 | ... | 9,84,000 | 0 | ... | 10,00,000 | 0 |
| 33. | 4½% ලංකා රජයේ ණය මුදල | (ජී) | 1987/91 | ... | ... | 40,00,000 | 0 | ... | 35,44,000 | 0 | ... | 40,00,000 | 0 |
| 34. | 4½% එම | (ඊ) | 1988/92 | ... | ... | 1,18,700 | 0 | ... | 1,04,218 | 40 | ... | 1,18,700 | 0 |
| 35. | 4½% එම | (බී) | 1989/93 | ... | ... | 10,00,000 | 0 | ... | 8,71,000 | 0 | ... | 10,00,000 | 0 |
| 36. | 5½% එම | (සී) | 1989/93 | ... | ... | 3,52,800 | 0 | ... | 3,53,858 | 40 | ... | 3,52,800 | 0 |
| 37. | 5½% එම | (එෆ්) | 1989/93 | ... | ... | 20,00,000 | 0 | ... | 20,02,000 | 0 | ... | 20,00,000 | 0 |
| | | | | | | 6,43,80,000 | 0 | | 5,92,82,112 | 30 | | 6,43,05,589 | 25 |

‘අ’ පරිශිෂ්ඨය

මගේ අංකය : ඕ–3/රා.සේ.අ.අ. (67–68)

**1968 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් මුදල් වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි ගිණුම් පිළිබඳව**

**ඔඩිටර් ජනරාල්වරයාගේ වාර්තාව**

(මෙම වාර්තාවෙහි මුදල් ගණන් ආසන්නම රුපියලට හරවා ඇත)

1968 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ගිණුම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥපනතේ (අධි. 434) 24 (1) වගන්තිය ප්‍රකාරව මගේ විධානය යටතේ ගණන් පරීක්ෂණයට භාජනය කරන ලදී.

2. 1968 සැප්තැම්බර් 30 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් මුදල් ප්‍රකාශයන්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පාලක මණ්ඩලයේ ලේකම්වරයා විසින් 1972 ජනවාරි මස 26 වැනි දින ගණන් පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලදී.

(i) 1968 සැප්තැම්බර් 30 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශයක්,

(ii) 1968 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් විසර්ජන ගිණුම,

(iii) 1968 සැප්තැම්බර් 30 වැනි දිනට ශේෂ පත්‍රය.

මෙම ගිණුම් පරීක්ෂණයේදී උද්ගත වූ මගේ නිරීක්ෂණයන් පහත දැක්වේ :

3. **ගිණුම් ප්‍රතිඵල.**—ආදායම් විසර්ජන ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලෙහි ආදායම රු. 23,91,896 ක් ද, වියදම, සාමාජිකයන්ගේ අවම මාසික ශේෂයන් මත වර්ෂයකට සියයට 3½ ගණනේ වෙන් කැරුන පොළියවූ රු. 21,36,605 කින් සහ ආයතනික වියදම් සහ දව භාණ්ඩ සහ උපකරණ විෂයන්ගේ ක්ෂය වශයෙන් වූ රු. 2,32,461 කින් සමන්විත වූ රු. 23,69,067 ක් ද විය. වර්ෂය සඳහා කාරක ප්‍රතිඵලය වූයේ රු. 22,829 ක අධිකයකි. මෙම අධිකය ගණන් බැලීමේදී, 1963–68 සියයට 3½ ස්වදේශාරක්ෂක ණය මුදල රු. 3,52,800 කට මුදල් කර ගැනීමේදී සිදුවූ පාඩුව රු. 8,750 ක මුදලක් ආදායම් විසර්ජන ගිණුමට හර නොකොට ආයෝජන සංචිත ගිණුමට හර කර තිබුනි. මෙකී අධිකය, කලින් වර්ෂයෙන් ඉදිරියට ගෙනා නිර්විසර්ජිත ශේෂය වූ රු. 79,921 ක් වූ මුදල හා එක්වීමෙන් රු. 1,02,750 ක් විය. එම රු. 1,02,750, ඊළඟ වර්ෂය සඳහා ඉදිරියට ගෙනයනු ලැබින.

**ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශය**

4. **ලැබීම්.—රජයේ දායක මුදල් කොටස රු. 34,50,000 :** මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥපනතේ 7 (1) වගන්තිය අනුව, එක් එක් මුදල් වර්ෂය තුලදී දායකයින් විසින් ගෙවනු ලබන අනිවාර්ය දායක මුදල්වල එකතුව මෙන් එක හමාරකට සමාන මුදලක් ඒ ඒ මුදල් වර්ෂය අවසානයේදී අරමුදලේ පොදු ගිණුමට බැරකළ යුතුයැයි නියම වෙයි. වර්ෂය තුලදී ලැබුණ එකතුව රු. 19,01,995 ක්වූ මුළු අනිවාර්ය දායක මුදල මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැන විසින් ගෙවිය යුතු වූයේ රු. 28,52,993 ක් නමුදු රු. 34,50,000 ක් ගෙවා තිබුනි. වැඩිපුර ගෙවා තිබූ රු. 5,97,007 ක මුදල් 1971 සැප්තැම්බර් මාසයේදී ඒකාබද්ධ අරමුදලට මාරු කොට ඇත.

5. **ගෙවීම්.—දායකයින්ට ප්‍රදානයන්—රු. 24,81,475 :** ඉහත සඳහන් රු. 24,81,475 ක්වූ මුදලෙහි ඇතුලත් එකතුව රු. 72,498 ක්වූ ගෙවීම්වලට අදාල වවුචර 358 ක්, ගණන් පරීක්ෂණය සඳහා, 1972 අප්‍රේල් 15 වැනි දින වනතෙක් ඉදිරිපත් කර නොතිබුණි.

සාමාන්‍ය

6. **අයකරගැනීම් ලේඛන.**—සියලුම දෙපාර්තමේන්තු සහ ගණක ඒකකයන් විසින්ම එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් නිසියාකාරව සැකසූ අයකර ගැනීම් ලේඛන, ඊළඟ වර්ෂයේ ඔක්තෝබර් මස 31 වැනි දින ඉක්මවීමට මත්තෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පාලක මණ්ඩලයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු යැයි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ සම්පාදිත 9 (×) රෙගුලාසියෙන් නියම වෙයි. එහෙත්, 1961–62 සිට 1964–65 කාලපරිච්ඡෙදය වෙනුවෙන් වූ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාල අයකරගැනීම් ලේඛන හතරක්, 1972 අප්‍රේල් 1 වැනි දිනට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් කාර්යාලය වෙත ලැබී නොතිබුනි.

මෙම ලේඛනයන් නොමැතිවීමෙන්, එක් එක් දෙපාර්තමේන්තුවේ හෝ ගණක ඒකකයේ හෝ අයකරගැනීම් ලේඛනවල දක්වා ඇති එකතුන්, වර්ෂය තුලදී එම දෙපාර්තමේන්තුව හෝ ගණක ඒකකය හෝ වෙනුවෙන් සැබවින්ම අරමුදලට බැර කැරුන මුදල් ගණන් සමඟ සැසඳිය යුතු බවට, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ සම්පාදිත 8 (V) වැනි රෙගුලාසියෙහි වූ නියමයන් පිළිපැදිය නොහැකි විය.

7. **කේවල දායක ගිණුම්.**—අරමුදල මගින් කේවල දායක ගිණුම් පවත්වනු නොලැබේ. කිසියම් දායකයකුගේ කේවල ගිණුම පිළියෙල කරනු ලබන්නේ ඔහුගේ බැරට අරමුදලෙහි ඇති ශේෂය අපහරණය කෙරෙන අවස්ථාවේදී පමණය. මේ නිසා කිසියම් දිනකට දායකයින්ගේ බැරට ඇති ශේෂයන්ගේ එකතුව නිශ්චය කළ නොහැකි විය.

කේවල ගිණුම් නොමැති නිසා, කිසියම් වර්ෂයක් අවසනට ප්‍රධාන ලැජරයෙහි දායක මුදල් ගිණුමෙහි බැරට ඇති ශේෂය, එදිනට කේවල ගිණුම්වල ශේෂයන්ගේ එකතුව සමග සැසඳීමට නුපුළුවන. එසේම, කිසියම් වර්ෂයක් සඳහා කේවල දායකයින්ට වෙන් කැරුන මුලු පොලී ප්‍රමාණය එම වර්ෂය සඳහා ආදායම් විසර්ජන ගිණුමට හර කැරුන මුදල සමග සැසඳීමක් කිරීමට ද නොහැකිවේ.

8. **දායකයින්ම විස්තර සැපයීම.**—එක් එක් මුදල් වර්ෂය අවසනට ඒ ඒ දායකයාගේ බැරට අරමුදලෙහි ඇති මුළු මුදල ගැන, එකී මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු හැකිතාක් ඉක්මනින් ඔහු වෙත දැක්විය යුතු යැයි, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනතේ 25 වැනි වගන්තියෙන් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට නියම වෙයි. 1942 වර්ෂයෙහි අරමුදල පිහිටවූ ද සිට කිසිම වර්ෂයක් වෙනුවෙන් මෙම නියමය පිළිපැද නොතිබුණි. මෙකී ව්‍යවස්ථිත නියමය පිලිපැදීමට නම්, ඉක්මණින් කේවල දායක ගිණුම් ලියා සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය වේ.

සී. සිවපාතසුන්දරම්,
ඔඩිටර් ජනරාල් වෙනුවට.

1972 මැයි මස 16 වැනි දින,
කොළඹ 7,
රජයේ ගණන් පරීක්ෂණ කාර්යාලයේ දීය.

පරිශිෂ්ටය 'අ'.

1967–68 වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව අනුව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පාලක මණ්ඩලයේ නිරීක්ෂණ

1–4 පරිච්ඡෙද—තොරතුරු දැන්වීමකි.

5 වැනි පරිච්ඡෙදය—මෙම ගෙවීම් වවුචර අදල දෙපාර්තමේන්තුවලින් ලබාගන ඉදිරිපත් කිරීමට ක්‍රියාකරගන යනු ලැබේ. මුල් ගෙවීම් වවුචර් නැතිවූ බව වාර්තාකොට ඇති අවස්ථාවන්හි ගෙවීම් සනාථ කිරීම සඳහා එයට සම්බන්ධිත අනිකුත් ලියකියවිලි පරීක්ෂණ සඳහා සපයනු ඇත.

6 වැනි පරිච්ඡෙදය—1961–62 සිට 1964–65 දක්වාවූ වර්ෂ සඳහා දකුණු කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලැබිය යුතුව තිබූ අවකරණ ලේඛන හතර දැන් ලැබී ඇත.

7 සහ 8 වැනි පරිච්ඡෙද—පරිගණක යන්ත්‍රාධාරයෙන් මෙම ගිණුම් පිළියෙල කිරීමට හැකි පහසුකම් ගැන පරීක්ෂණ කරගන යනු ලැබේ.

ලෙනාඩ් පානම්බලන,
සභාපති,
රා.සේ.අ.අ. කළමනාකාර මණ්ඩලය.

ඩබ්ලිව්. චන්ද්‍රසේන,
ලේකම්,

රා.සේ.අ.අ. කාර්යාලය,
3 මහල ලොයිඩ්ස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1972 නොවැම්බර් 13.
1–107

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සමාගම් ආඥා පනත (145 වැනි අධිකාරය)**

**277(3) වගන්තිය යටතේ සීමාසහිත මංගල වුවර්ස් නම කපා හැරීමේ දැන්වීමයි**

සමාගම් ආඥාපනතේ (145 අධිකාරය) විධිවිධාන යටතේ 1962.7.16 දින සංස්ථාපිත සමාගමක් වන සීමාසහිත මංගල වුවර්ස් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, සීමාසහිත මංගල වුවර්ස් නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් රුවන්පුර ලික්මන්ඩ් ද සිල්වා වන මම, සමාගම් ආඥා පනතේ (145 අධිකාරය) 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

රුවන්පුර ලික්මන්ඩ් ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1972.12.18 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදීය.
1–86

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

**(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)**

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනවිත් භාර දීමට හෝ පුළුවන්.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දවල් 12 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6 ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නාට නියමිත " පිටපත " කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. 1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 68.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | මෙරට රු. | ශ. | | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම් වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණ ය.

* තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිල රු. | ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 60 | ... | 0 | 15 |

දායක මුදල් භාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන **ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතුනම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. **සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් ප්‍රතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 සිකුරාද | 72.12.29 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 1.12 සිකුරාද | 73. 1. 5 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 1.19 සිකුරාද | 73. 1.12 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 1.26 සිකුරාද | 73. 1.19 සිකුරාද | දහවල් 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 සිකුරාද | 73. 1.26 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාද | 73. 2. 2 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්ද | 73. 2. 9 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 2.23 සිකුරාද | 73. 2.15 බ්‍රහස්පතින්ද | දහවල් 12.00 |
| මාර්තු | 73. 3. 2 සිකුරාද | 73. 2.23 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද | 73. 3. 2 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද | 73. 3. 9 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද | 73. 3.16 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද | 73. 3.23 සිකුරාද | දහවල් 12.00 |
| අප්‍රේල් | 73. 4. 6 සිකුරාද | 73. 3.30 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 4.11 බදාද | 73. 4. 6 සිකුරාද | දහවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින් | 73. 4.11 බදාද | දහවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද | 73. 4.19 බ්‍රහස්පතින්ද | දහවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි